# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 1412 /2023

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2023 திகதி

දිනය / Date — 11/11/2023 පැය 2000

## මාධ්‍ය නිවේදනය

**රුපියල් ලක්ෂ 20 ක කප්පම් මුදල් ඉල්ලා දුරකතනයෙන් තර්ජනය කිරීමක් සම්බන්ධයෙන් සැකකරුවෙකු අත්අඩංගුවට - නුගේගොඩ කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශය.**

හෝමාගම පොලිස් වසමේ දකුණු පිටිපන ප්‍රදේශයේ පදිංචි පෙර පාසල් ගුරුවරියකට දුරකථනය මඟින් මරණ තර්ජනය සිදුකර රුපියල් ලක්ෂ 20 ක මුදලක් ඉල්ලා සිටින බවට හෝමාගම පොලිස් ස්ථානයට ලද පැමිණිල්ලකට අනුව නුගේගොඩ කොට්ඨාස භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිවරයාගේ උපදෙස් මත කොට්ඨාස අපරාධ විමර්ශන අංශය මඟින් විමර්ශනයක් ආරම්භ කර තිබුණි.

ඒ අනුව විමර්ශන නිලධාරින් විසින් 2023.11.10 වන දින වන දින හෝමාගම ප්‍රදේශයේදී උපක්‍රමශීලීව කප්පම්කරු කැඳවා කප්පම් මුදල් ලබා දෙන අවස්ථාවේදී සැකකරු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 51 ක් වන දකුණු පිටිපන, හෝමාගම ප්‍රදේශයේ පදිංචි 484 ඊ, සුවපුබුදුගම ග්‍රාමසේවා වසමේ ග්‍රාම නිලධාරිවරයා බවට අනාවරණය වී ඇත.**

සැකකරු කප්පම් මුදල් ලබාගැනීමට පැමිණි යතුරුපැදිය, තර්ජනය කිරීමට යොදාගත් ජංගම දුරකථන දෙකක් හා ග්‍රාම නිලධාරි හැඳුනුම්පත ද පොලිස් භාරයට ගෙන ඇත. මෙවැනි කප්පම් ඉල්ලීම් කිහිපයක් පිළිබඳව තවත් පැමිණිලි ලැබී තිබෙන අතර එම පැමිණිලිවලට අදාල කප්පම් ඉල්ලීම් මෙම සැකකරු විසින් සිදුකර ඇති බවට පොලීසිය සැක කරනු ලබයි. නුගේගොඩ කොට්ඨාස අපරාධ විමර්ශන අංශය වැඩිදුර විමර්ශන සිදු කරගෙන යනු ලබයි.

මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය
පොලිස් මාධ්‍ය කොට්ඨාසය.